## වර්ෂ 2021 ක්වූ ජූලි මස 20 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

- පැමිණීම

| | |
|---|---|
| 01.D.G ගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ි රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05. .S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 D.G ජයන්ත කීතර්ිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07. W.M.G.W.C.B වේරපිටිය මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08.U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11. D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12. W.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13. R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14. A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19. H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20. R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21. A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22. මුතු නීලමේගම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23. තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

24. H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

25. W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

26. P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

27. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28 . G.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29. H.G සුභද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

30. K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

31. පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

32. කුමාරවේලු කනගරත්නම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

33. N.R.M.D නවරත්න රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

34. ගයානි ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

35. චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

36. M.G උපචන්ද්‍ර ජයපති මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37. M.G.R පාලිත අබේරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38. D.M දීසායු මංජුල දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39. R.M උදයකුමාර දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

40. H.M නීල් සුගත් කුමාර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

41. D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

42. වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

43. සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සහා සම්මත කිරිම</u>

පසුගිය ජූනි මස 17 වන දින මහ සභා වාර්තාව සහා සම්මත කර ගැනීම.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පසුගිය ජූනි මස 17 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය ජ්‍යෙෂ්ඨත්වය අනුව නිවැරදිව සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදි.තවද මහ සභා වාර්තාවේ පස් වන පිටුවේ තමා සදහන් කල ආදාහනාගාරය සම්බන්ධ ප්‍රකාශයේ ගුරුකැලේ වසමේ බුම්මලේ ලෙස නොව ගොඩවෙළ වසමේ බුම්මලේ ලෙස නිවැරදි විය යුතු බවත් සදහන් කරන ලදි.

තමාගේ කොට්ඨාශය ගැන කථා කල බවත් යම්කිසි සහනයක් රජය විසින් සලසා දෙනවා නම් තමාගේ කොට්ඨාශයට මූලිකත්වය ලබාදෙන ලෙස ඉල්ලා සිටිය නමුත් සහනයක් මේ දක්වා නොලැබුණු බවත් තමා සදහන් කල කරුණු කෙටියෙන් දක්වා ඇති බවත් එනිසා තමාගේ ප්‍රකාශයේ වැදගත් කරුණු තෝරා බේරා ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කරමින් ඉහත සංශෝධන වලට යටත්ව මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙසට මම යෝජනා කරමි.

<u>ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

තමා එම කාරණා නිවැරදි කරන බව සදහන් කරන ලදි.

*ඒ අනුව සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>

**ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

1. අපි මුළු රටක් ලෙස අපේ ගරු ජනාධිපතිතුමා,ගරු අගමැතිතුමා ගරු අමාත්‍ය මණ්ඩලය එකතුව සියළු දෙනාගේ සහයෝගයෙන් පක්ෂ භේදයෙන් තොරව විශාල එන්නත්කරණ වැඩසටහනක් කරගෙන යන බවත් පක්ෂ පාට කිසිවක් නොව සියළුම ජනතාව වෙනුවෙන් කටයුතු කරන බවත් තමාද මන්ත්‍රී මණ්ඩලයේ තීන්දු තීරණ මත මහ සභාවේ විශාල මුදලක් වැය කර ඒ සදහා අවශ්‍ය කටයුතු ඉටු කරන බවත් ලංකාවේ සියළු පළාත් පාලන ආයතන මේ සදහා දායකත්වය දරන බවත් අපිද වාහන සහ කම්කරුවන් යොදවා ගෙන එන්නත්කරණ වැඩසටහන් සදහා සියළු දේ ඉටු කරන බවත් අපේ බල ප්‍රදේශයේ මැති ඇමතිවරු සියළු දෙනාට අපගේ සහයෝගය දෙන බවත් සභාවේ මන්ත්‍රීවරු ලෙස පවසා එන්නත්කරණ මධ්‍යස්ථාන වගට කෑම දෙන්න කියා ආයතන වලට ගොස් කවුරුන් හෝ මුදල් එකතු කිරීමට එලටන් ප්‍රදේශයට ගොස් ඇති බවත් නමුත් තමා කිසි දිනක ව්‍යාපාර ආයතන වලින් මුදල් ඉල්ලා අවශ්‍යතා සපුරා ගැනීමට තමාට හැකියාවක් තිබුනද තමා කිසි දිනක එසේ නොකරන බව ගරු මන්ත්‍රී මණ්ඩලය දන්නා බවත් අපි පොඩි මුදලක් ලබාගෙන සභාපති සහ මන්ත්‍රී මණ්ඩලය එක්ව මෙවන් කටයුතු ඉටු කරනවා කියා ඇසීමට අකමැති බවත් එලෙස කටයුතු කිරීම සභාවට කරන අගෞරවයක් බවත් තමා තමන්ගේ පුද්ගලික වියදමින් .27100.00 මුදලක් ගෙවා වහුගපිටිය රෝහලේ එන්නත්කරණ මධ්‍යස්ථානයට ආහාර ලබා දුන් බවත්

මෙලෙස මුදල් එකතු කිරීමේ කටයුතු කවුරුන් හෝ සිදු කරනවා නම් එම කටයුතු වලක්වන ලෙසත් දුරකථනයෙන් හෝ දැනුවත් කරන ලෙසත් ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින ලදි. මෙවන් ලැජ්ජා සහගත කටයුතු සිදු කරනවා නම් නීතියෙන් ක්‍රියා කල හැකි බවත් එනිසා මෙවන් කටයුතු වැළැක්වීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

ගරු ආණ්ඩුකාරතුමාගේ රැස්වීමේදී ආවරණ අනුමැතියට යටත්ව එන්නත්කරණය සඳහා මුදල් වියදම් කිරීමට පැවසූ බවත් බොහෝ විට මෙම මුදල් පළාත් සභාවෙන් ප්‍රතිපූරණය කිරීමට ඉඩ තිබෙන බවත් සභා තීරණ නොගෙන සියළු කටයුතු ඉටු කර ඇති බවත් දන්වා සිටිමි.

<u>3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සඳහන් කරන ලදි.

<u>4.කල් දී ඇති ප්‍රශ්න</u> - නොමැති බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>5.කල් දී ඇති යෝජනා</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (1)</u>

5(1.1)ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා වාෂරීක නඩත්තු ගිවිසුම් ගාස්තු ලෙස එකකට රු11.500 බැගින් යන්ත්‍ර දෙකටම රු.23000 ක මුදලක් ගෙවීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>**

ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා වාෂරීක නඩත්තු ගිවිසුම් ගාස්තු ලෙස එකකට රු 11.500 බැගින් යන්ත්‍ර දෙකටම රු.23000 ක මුදලක් ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (2)</u>

5(1.2) PF-7352 කැබ් රථයේ අළුත් වැඩියාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව යුනයිටඩ් මෝටසර් ලංකා - පීඑල්සී කටුගස්තොට යන ආයතනයට ඇස්තමේන්තු මුදල ලෙස රු.1,144,288.39ක් අළුත්වැඩියාව සඳහා ගෙවීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

සභාව සතු අපේ අළුත්ම කැබ් රථය මෙය බවත් මෙහි යම්කිසි දෝෂයක් නිසා අද අකමර්ණ්‍ය වී ඇති බවත් මෙය ගරු සභාපතිතුමාගේ නිළ රථය බවත් නමුත් දැනට භාවිතයට ගත නොහැකි තත්වයට පත් වී ඇති බවත් සේවා කාලය ඉක්ම ගොස් ඇති නිසාත් වර්තමානයේ මෙම රථයේ වටිනාකම එක් කෝටි දස ලක්ෂයක් පමණ වන බව වාහන භාවිතා කරන මන්ත්‍රීතුමන්ලා පවසන නිසාත් මේ වාහනය සභාවේ සම්පතක් නිසා ආරක්ෂා කර ගත යුතු බවත් PF-7352 කැබ් රථය බොහෝම අබලන් තත්වයේ පවතින නිසාත් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගතයුතු බවත් මෙම කැබ් රථය අලෙවි කල යුනයිටඩ් මෝටසර් ආයතනයෙන්ම ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති නිසා අපි වාහනය අළුත්වැඩියා කල යුතු බවත් එනිසා සභාවේ සම්පතක් වන PF-7352 කැබ් රථය රු.1,144,288.39ක් වැයකර අළුත්වැඩියා කල යුතු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

PF-7352 සභාවේ නිළ කැබ් රථය ගැන කථා කිරීමේදී මේ පිළිබඳව ගැටළුවක් ඇති බවත් මෙහි ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු ආරියවංශ මහත්මිය විසින් වාර්තාවක් එවා ඇති බවත් ඒ අනුව යුනයිටඩ් මෝටසර් ආයතනය මඟින් රු.1,144,288.39ක මුදලක් ඇස්තමේන්තුව එවා ඇති නමුත් මේ සම්බන්ධයෙන් ගැටළුකාරී බැවින් මේ පිළිබඳව ආයතනය සැලකිලිමත් වන ලෙස වාර්තාවක් ලබා ඇති බවත් මෙම කැබ් රථයේ එන්ජිම සම්පූර්ණයෙන්ම විනාශ වීම පිළිබඳව වගකීමක් භාර ගැනීමට නොහැකි බව සඳහන් කර ඇති බවත් යුනයිටඩ් මෝටසර් ආයතනයේ සම්පූර්ණ විස්තරයක් එවා ඇති මුත් මෙහි එන්ජිම් ඔයිල් පොම්පයේ කාන්දුවීමක් නිසා එන්ජිමට හානි වී ඇති බවත් එන්ජින් එකෙහි ප්‍රමාණයට වඩා වාහනයේ තෙල් පවතින බවත් තෙල් කූරෙන් තෙල් ප්‍රමාණය බැලිය හැකි බවත් එලෙස පරීක්ෂා කර නොමැති බවත් වාහනයට අවශ්‍ය තෙල් ප්‍රමාණය ලීටර් 4 නම් දැනට ලීටර් 6ක් ඇති බවත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

දෙවරක් යුනයිටඩ් මෝටසර් ආයතනයෙන් පැමිණ වාහනයේ ලයිට් එක පත්තු වන නිසා ධාවනය කරන ලෙස පැවසූ බවත් සේවා කිරිම සිදුකල සතියකින් පසුව මෙම ගැටළුව මතු වූ බවත් සේවා කිරීම මෙම ආයතනයෙන්ම සිදු කල බවත් සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මෙම වාහනයේ සම්පූර්ණ වගකිම යුනයිටඩ් මෝටසර් ආයතනය භාරගත යුතු බවත් සාමාන්‍ය ක්‍රමවේදය අනුව වාහන ලක්ෂයකටවත් පොම්පයේ ගැටළුවක් ඇති නොවන බවත් ඩීසල් උඩට අදින පොම්පයේ කාන්දුවීමක් සාමාන්‍යයෙන් සිදු නොවන බවත් වාහනය ඔයිල් නොමැතිව ධාවනය කර ඇති බවත් එසේ නොමැති නම් එන්ජින් ඔයිල් මාරු නොකර ධාවනය කර ඇති බවත් මෙම ක්‍රමවේද දෙකෙන් එකකට වාහනයේ එන්ජිම සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති බවත් එනිසා මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකල යුතු බවත් මෙම ආයතනයෙන් ලබාදී ඇති ඇස්තමේන්තුව අපට පිළිගත නොහැකි බවත් මෙහි ඔයිල් පොම්පයේ කාන්දුවක් නිසා මෙම ක්‍රියාදාමය සිදු වී ඇති බව සඳහන් කර ඇතිමුත් මෙම ඇස්තමේන්තුවේ කිසිම තැනක ඔයිල් පොම්පයක් දැමිය යුතු බවට කිසිදු සටහනක් නොමැති බවත් එසේනම් තිබෙන ඔයිල් පොම්පයම දමා අළුත්වැඩියා කිරීමට යන බවත් එවිට නැවත ලක්ෂ 11ක් පමණ වැය වන බවත් යුනයිටඩ් මෝටසර් ආයතනය රජයේ වාහන වලට කරන අපරාධය සම්බන්ධයෙන් වහාම විධිමත් පරීක්ෂණයක් කල යුතු බවට

තමා ඉල්ලීම් කරන බවත් මෙය දැවැන්ත අපරාධයක් බවත් 147000KM ධාවනය කර ඇති වාහනයකට ලක්ෂ 15ක පමණ වගකීම් කාලයක් ඇති බවත් වගකීම් කාලය පසු වූවත් කිලෝමීටර් ගණනාවක් පවතින බවත් නවීන වාහනයක කිලෝමීටර් ලක්ෂ දෙකක සීමාවක් පවතින බවත් එනිසා යුනයිටඩ් මෝටසර් ආයතනය මේ වාහනය පරීක්ෂා කර බලා ධාවනය කරන්න කීවා නම් එය එම ආයතනයේ සම්පූර්ණ වරද බවත් මීටරයේ ලයිට් එක දැල්වී සංඥා කරන්නේ මෙම වාහනයේ එන්ජිම සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති බව යැයිද එවන් එන්ජිමකට ඔයිල් දැමුවාට බල්බ් එක නැවත නිවෙන්නේ නැති බවත් පොම්පයේ ක්‍රියාකාරිත්වය නොමැති බවත් එනිසා මේ පිළිබඳ සම්පූර්ණ වගකීම යුනයිටඩ් මෝටසර් ආයතනය වෙත පවරා විධිමත් පරීක්ෂණයක් කල යුතු බවත් පරීක්ෂා කර බලා ධාවනය කිරීමට උපදෙස්දීම බරපතළ වරදක් බවත් එම දිනයේ ගැටළුව හඳුනා ගත්තා නම් මෙවන් විනාශයක් සිදු නොවන බවත් මේ සඳහා මහජන මුදල් වැය කිරීම නුසුදුසු බවත් එනිසා සභාවේ මුදල් වැය කර වාහනය අළුත්වැඩියා කිරීමට තමාගේ බලවත් විරෝධය එල කරන බවත් මෙම ආයතනය මෙහි වගකීම සම්පූර්ණයෙන් භාරගත යුතු බවත් යෝජනා කරන ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

මෙම රථයේ රියදුරු මහතා ඔයිල් ලැම්ප් එක දැල්වුනු පසු ඔයිල් අඩු වීමක් ගැන සභාවට දැනුම් දුන්නාද යන්නත් අදාළ ආයතනයෙන් පැමිණ බල්බය දැල්වුන නිසා ධාවනය කරන්න කියූ බවට ලිඛිත විස්තර තිබෙනවාද යන්නත් එසේ නොමැතිව වාචික ප්‍රකාශ මත ධාවනය කර ඇති බවත් මෙය සභාවට අවශ්‍ය කැබ් රථයක් බවත් අපි මෙම වාහනය ගාල් වෙන්න නොදී අළුත්වැඩියා කරගත යුතු බවත් උසාවියේ ලියාපදිංචි නොවූ වාහන දිරාපත් වන බවත් ඊළඟට පත්වන සභාපතිවරයාට ගමන්කිරීමට තිබෙන වාහනය බවත් මෙම වාහනය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවත් මේ සඳහා මාස 7-8ක කාලයක් ගත වූවොත් වාහනය තව ලෙඩ වී විනාශ වී යා හැකි බවත් සවරීස් කර සතියක් යන විට ඔයිල් අඩු වූවා නම් යටින් යා යුතු බවත් රියදුරු මහතාගෙන් අසා දැනගත යුතු බවත් පොම්පය ඇතුලේ ප්‍රශ්නයක් තිබුනා නම් රියදුරා නොදන්නා බවත් ඔයිල් නොමැතිව ධාවනය කළා නම් රියදුරාගේ වරදක් තිබෙන බවත් යුනයිටඩ් මෝටසර් ආයතනය රජයේ අළුතින් එන කැබ් රථවල සේවා කටයුතු ඉටු කරන බවත් රජයේ වාහන රජයේ පිළිගත් ස්ථාන වලින් අළුත්වැඩියා කල යුතු නිසා පිළිගත් ආයතනයක් ලෙස යුනයිටඩ් මෝටසර් ආයතනයට යොමු කර ඇති බවත් එම ආයතනය වරදක් කර ඇත්නම් එම කටයුත්ත තමාද අනුමත කරන බවත් නමුත් මෙම වාහනය සති දෙකකට කලින් සවරීස් කලා නම් ඔයිල් දැමූ පසු ඔයිල් පිච්චෙනවා නම් ඔයිල් පම්ප් එකේ සිරවීමකදී එන්ජිමට හානි සිදුවිය හැකි බැවින් තමා ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටින්නේ විනාශයක් සිදුවිය හැකි නිසා කල්පනාකාරීව තීන්දු ගත යුතු බවත් අපි බුද්ධිමත් පරීක්ෂණයකට යොමු කර වාහනය අළුත්වැඩියාවට යොමු කල යුතු බවත් රජයේ වාහන වල සිදුවන හානි ලෙස කෘෂිකමර් අමාත්‍යාංශයේ,මහා මාගර් අමාත්‍යාංශයේ කුඩා කුඩා අඩුපාඩු නිසා ඉවත් කර තිබූ බවත් මේවා විශාල අපරාධ බවත් එනිසා ගරු ශාන්ත මන්ත්‍රීතුමා,ගරු වේරපිටිය මන්ත්‍රීතුමා,ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා,ගරු අගලවත්ත මන්ත්‍රීතුමා යන ජ්‍යොෂ්ඨ මන්ත්‍රීවරු එකතු වී සොයා බලා කටයුතු කරන ලෙසත් එනජිම ඇතුලේ තිබෙන පොම්පය සම්බන්ධයෙන් රියදුරු මහතා නොදන්නා බවත් ගැටළුවක් ඇත්නම් පරීක්ෂණයක් පවත්වා මන්ත්‍රී මණ්ඩලය විමසා කටයුතු කරන ලෙසත් එතෙක් වාහනය අළුත්වැඩියා කල යුතු බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමා සභාපතිවරයා ලෙස භාවිතා කල නිළ රථය මෙය බවත් මෙම රථයේ සියළු විස්තර ලිපිගොනු තිබෙන නිසා පරික්ෂා කර බලා කටයුතු කරන ලෙසත් එහි සේවා කල දින වකවානු සියළු දේ පවත්නා බවත් ඒ අනුව කමිටුවක් පත්කර සොයා බලා තීරණය කරන ලෙසද ලයිට් එක දැල්වෙන නිසා ධාවනය කරන ලෙස යුනයිටඩ් මෝටසර් ආයතනයෙන් දැන් වූ බවත් තෙල් දමා නැවත ධාවනය කරන ලෙස දන්වා ඇති බවත් තමාට තීරණ ගත නොහැකි නිසා මහ සභාවට යොමු කල බවත් සඳහන් කරන ලදි.

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

යුනයිටඩ් මෝටසර් ආයතනයෙන් පැමිණ මෙම වාහනය ධාවනය කරන ලෙස වාචිකව දැන් වූ බව සභාපතිතුමා සහ ලේකම්තුමිය වගකීමෙන් ප්‍රකාශ කල බවත් තමාද මෙවැනි වාහනයක් භාවිතා කල බවත් එම වාහනයේ බල්බය පත්තු වන නිසා කාමරීක නිළධාරි මහතා ජ්ලග් එක මාරු කර සවිකර දුන් බවත් එම අවස්ථාවේදී බල්බය පත්තු වී ඩනය වැඩි වූ නිසා මඟදී නිවෙන බවත් එවිට තෙල් වැඩ නොකරන නිසා එන්ජිම ක්ෂය වී විනාශ වන බවත් නමුත් යුනයිටඩ් මෝටසර් ආයතනයේ නිළධාරින් සභාවට පැමිණ දන්නා අය නම් ඔයිල් ජ්ලග් එකේ වයර් එක ශෝරට් කර හෝ ජ්ලග් එක මාරු කර බලන්න තිබූ බවත් මෙම අය වැරදි උපදෙස් දීම සම්බන්ධයෙන් අපගේ කණගාටුව ප්‍රකාශ කරන බවත් වාහනය පරීක්ෂා කර බලා තීරණයක් ලබාදීම කල යුතුව තිබූ බවත් ඔයිල් පොම්පය ගැන මෙම ආයතනය කිසිදු සඳහනක් කර නොමැති බවත් අඩුම තරමින් ස්විචයේ ප්‍රශ්නය විසඳුනා නම් මෙම අය ප්‍රෙශර් පොම්පය ගැන කථා නොකර ඇති බවත් සියළු අංගෝපාංග දමා සාදන්න කියා විශාල මුදලක් ඉදිරිපත් කර ඇති බවත් මෙම අයගේ වගකීම් කාලය අවසන් නම් එම ආයතනයටම දමන්න කියා හේතුවක් නොමැති බවත් රජය අනුමත කරන වෙනත් ආයතන සමඟ අපට මිළ ගණන් සංසන්දය කිරීමට හැකියාවක් ඇති බවත් එනිසා අළුත්වැඩියා කිරීම කල යුතු බවත් මෙම ආයතනය 8% බදු මුදලක් ඇතුළත් කර ඇති බවත් අඩුම තරමින් 50% වත් අඩු කිරීමක් කර සහනයක් ලබාගත යුතු බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ගියවර ඔබතුමන්ලා ලබාදුන් සභා තීරණය පරිදි විවෘතකර ඇති ආයතනයකින් සේවා කිරීම සිදුකල බවත් ඒ අනුව යුනයිටඩ් මෝටසර් ආයතනය මෙම වාහනය සවරීස් කිරීම වෙනුවෙන් රු.67000.00ක මුදලක් ලබාගත් බවත් වෙනත් ස්ථානයකට සේවා කටයුතු සඳහා යොමු කලා නම් රු.15000.00,රු.20000.00 වැනි මුදලකට කර ගත හැකි බවත් එම ආයතනයේ අය පැමිණ තෙල් අඩුයි කියා තෙල් දමා පරීක්ෂා කර ඇති බව සඳහන් කරන ලදි.

ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා

මේ වාහනයේ බෙයාරින් පළුවක් නොමැති බවත් ක්නෙක්ට් රොඩ් එකක් කඩාගෙන ගොස් ඇති බවත් එතරම් දෙයක් වීමට මෙම වාහනය ශබ්දය ඇහෙද්දි ධාවනය කර ඇති බවත් වාහනය ගැන රියදුරුගේ අවධානය තිබිය යුතු බවත් වාහනයේ කිසියම් ශබ්දයක් රියදුරුට දැනෙන බවත් මෙපමණ විනාශයක් වන්නට මෙම වාහනය කෙසේ ධාවනය කලාද යන්න ගැටළුවක් ඇති බවත් වාහනයේ ගත හැකි එකම දෙය ඔයිල් පොම්පය බවත් එහිද දෝෂයක් පවතින බවත් ඔයිල් මීටරය වැඩ නොකලා නම් දැමූ ප්‍රමානයට වඩා ඔයිල් වැඩි වෙන්නේ කෙසේදැයි විමසන ලදි. ඔයිල් අඩුවෙනවා කියා හිතාගෙන ඔයිල් දමා ඇති බවත් මෙය බරපතල ගැටළුකාරි වරදක් බවත් සඳහන් කරන ලදි.

<u>ගරු දිනුක රත්නායක මන්ත්‍රීතුමා</u>

තමා සිතන ආකාරයට සභාවට විශාල ප්‍රයෝජනයක් ලබා ගත් වත්කමක් ලෙස මෙම වාහනය භාවිතා කල බවත් ගරු සභාපතිතුමාගේ මෙන්ම කායර් මණ්ඩලයේ කටයුතුද මෙම වාහනය භාවිතා කිරීමට නොහැකි නිසා අඩාල වී ඇති බවත් මෙවන් වාහන තමා මෙන්ම ගරු පාලිත මන්ත්‍රීතුමාද භාවිතා කර ඇති නිසා ඉතා හොඳ වාහනයක් බව දන්නා බවත් මේ සම්බන්ධයෙන් විවිධ මත පල වූ බවත් මෙය රියදුරු මහතාගේ වරද බව තමා එක හෙළාම සඳහන් කරන බවත් මෙම වාහනය තෙල් නොමැතිව ධාවනය කල නිසා මෙම ඉරණම අත්වී ඇති බවත් තමාද නැවක ප්‍රාථමික ඉංජිනේරුවරයෙකු ලෙස කටයුතු කර ඇති නිසා මේ සම්බන්ධයෙන් යම් ප්‍රමාණයක දැනුවත්කමක් ඇති බවත් වාහනය එන්ජින් ඔයිල් නොමැතිව ධාවනය කර ඇති නිසා එන්ජිම සීස් වෙන්න තරම් බෙයාරින් පළු කැඩිලා යන්න තරම් ප්‍රිස්ටන් සීස වෙන්න තරම් හානියක් වීමට මෙය හේතුවක් බවත් යුනයිටඩ් මෝටසර් ආයතනයට අපි චෝදනා කලත් හැකිනම් කමිටුවක් පත් කර කටයුතු කල යුතු බවත් නමුත් එම ආයතනය කුමක් හෝ කරුණක් ඉදිරිපත් කර මෙම හේතුව නිසා සිදු වූ බවට හේතු පෙන්වා දෙන බවත් එවන් අවස්ථාවක අපට ඔප්පු කල හැකි කිසිවක් නොමැති බවත් සවරීස් කර වාහනය අපට දෙන බවත් එහිදි යම් යම් දේවල් සිදුවන බවත් එහිදි පිල්ටර් මාරු කරනවා කියා නැවත එම පිල්ටරයම ශුද්ධ කර නැවත යොදන බවත් සවරීස් කර සති දෙකකින මෙවැන්නක් සිදුවීම යුනයිටඩ් මෝටසර් ආයතනයේම වරදක් ලෙස පෙන්විය නොහැකි බවත් රියදුරු මහතාගේ ප්‍රධානම ගැටළුවක් ඇති බවත් වාහනයක් ධාවනය සඳහා භාර ගැනීමේදී තෙල්,වතුර සියල්ල බැලිය යුතු බවත් මහදි ගැටළුවක් ආවා නම් පොම්පයේ ප්‍රශ්නයක් ආවොත් එන්ජින් අවුට් පොම්පයක් තිබෙන නිසා තෙල් ලීක් වී යා හැකි බවත් රියදුරු පරීක්ෂා කරන අවස්ථාවේ හෝස් එකෙන් ලීක් වී එන්ජින් ඔයිල් ඉවත් විය හැකි බවත් එම ආයතනයම එන්ජිම ගලවා ඇත්නම් අපට කල හැකි දෙයක් නොමැති බවත් අපි එම ස්ථානයට ගොස් වාහනය පරීක්ෂා කර බැලිය යුතු බවත් එතෙක් රියදුරාට යුනයිටඩ් මෝටසර් ආයතනයට එකහෙළාම චෝදනා කල නොහැකි බවත් මේවා සභාවේ මුදල් බවත් මෙය අපරාධ මුදලක් බවත් එනිසා කමිටුවක් පත්කර ඒ අනුව තීරණයක් ගනිමු යැයි යෝජනා කරන ලදි.

<u>ගරු අරුණ ප්‍රසන්න මන්ත්‍රීතුමා</u>

2021.05.05 වන දින කැබ් රථය අළුත්වැඩියා කරන්න ලිපි යවා ඇති බවත් නමුත් යාන්ත්‍රික ඉංජිනේරු ආරියවංශ මිය එවා ඇති ලිපියට අනුව 147510KM කින් නතර වී ඇති බව යැයිද 2021.04.30 ධාවන සටහනට අනුව 149906 KM ලෙස දක්වා ඇති බවත් එවිට 2021.04.30 දින සිට 2021.05.05 දක්වා දින 05 තුළ 2396 KM අඩු විය යුතු බවත් 147906KM කින් වාහනය නතර වී ඇත්තේ 04.30 ධාවන සටහනේ අවසානයට 149906 KM සඳහන් බවත් 2021.05.05 ලිපියත් සමඟ වාහනය නතර වී ඇත්තේ 147910KM ලෙස බවත් මෙය ඔබතුමාට චෝදනා කිරීමක් නොවන බවත් ඔබතුමා මෙම සභාවේ ප්‍රධානියා බවත් නමුත් මෙම සභාවේ වාහන වල වත්කම් වලට මහ සභාව වගකිව යුතු බවත් ජනතාව අපෙන් විමසන විට පවසන්නේ කුමක්ද යන්නත් රු.1,144,288.39ක මුදලක් යනු කුඩා මුදලක් නොවන බවත් එක් මන්ත්‍රීවරයෙකුට ලැබෙන ප්‍රතිපාදන මුදල රු.ලක්ෂ 7ක් බවත් එනිසා මහ සභා යෝජනාවක් අනුමත කර සිදුවීම යුනයිටඩ් මෝටසර් ආයතනයේ නිළධාරින්ට මෙම ලිපිය යැවිය යුතු බවත් වාහන සියල්ල මෙම ස්ථානයෙන් සවරීස් කරනවා නම් එම ආයතනය වගකීම් විරහිතව පැමිණ වාචිකව අදහස් දක්වනවා නම් එම ආයතනයේ ම වරදක් බවත් අපි මෙම ආයතනයට විරුද්ධව නීත්‍යානුකූලව ඉදිරියට යාමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් මෙය සභාවේ වාහනයක් බවත් මහ සභාව ලෙස රු.1,144,288.39ක මුදලක් වැය කිරීම අප

සියළු දෙනාටම බලපාන බවත් මේ සියළු කාරණා පිළිබඳව අවධානය යොමු කර උඩපළාත ප්‍රාදේශීය සභාව ලෙස සිදුවන අලාභය පිළිබඳව ලිඛිතව උපදෙස් නොදුන් නිසා මෙම ආයතනය වගකිව යුතු බවට තමා යෝජනා කරන බව සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මෙම රියදුරු කෙරෙහි විශ්වාසයක් තැබිය නොහැකි බවත් වාහනයේ එන්ජිම කැඩුණු නිසා මෙම ගැටළුව මතු වූ බවත් අපට ලබාදෙන ධාවන සටහන් වාර්තා සියල්ල අප පිළිගන්නා බවත් ධාවන අංශය භාරව නිළධාරි සිටින බවත් වාහනයේ එන්ජිම කැඩුණු නිසා ධාවන සටහන් සැසදෙන බවත් මෙම නිළධාරි මීටරය කියවා ධාවන සටහන් අත්සන් කරනවාද යන්නත් 149810KM කට අත්සන් කර ධාවන සටහන මෙම සභාවට යොමු කර ඇති බවත් මේ සමහර වාර්තා අපි එකවර කමිටු වාර්තා කියා අනුමත කරන බවත් එවිට මෙතෙක්කල් බොරු වාර්තා අපි අනුමත කර ඇති බවත් මෙයින් අපි කිසිවෙකුට ගැලවීමක් නොමැති බවත් අපි එක් එක්කෙනා මේ සම්බන්ධයෙන් වගකිව යුතු බවත් බොරු ධාවන සටහන් අනුමත කර ඇති බවත් මැයි මාසයේ 15 වනදා තෙක් වාහනය ධාවනය කල බවත් 153000KM පමණ වාහනය ධාවනය කල යුතු බවත් නමුත් ධාවනය කර ඇත්තේ 147000KM බවත් ඒ අනුව බොරු වාර්තා මෙම සභාවට ඉදිරිපත් කර ඇති බවත් වාහනය කැඩුණු නිසා එම වැරදි ඔප්පු වන බවත් මෙහි නිළධාරින්ගේ පවා වරදක් ඇති බවත් සභාවේ අනෙක් වාහන ගැනත් තත්වය මෙලෙසම බවත් නිළධාරින්ට අතිකාල බටා මොනවා ගෙව්වත් වාහනයේ මීටරය කිසිවෙක් බලා නොමැති බවත් රියදුරු දෙන වාර්තා අනුමත කර ඇති බවත් වාහන සඳහා වෙන වෙනම නිළධාරින් පත්කරත් මහජන මුදල් අව භාවිතයක් සිදු වී ඇති බවට මේ වන විට ඔප්පු වී ඇති බවත් ඉංජිනේරුතුමියගේ ලිපියට අනුව මීට වඩා වාහන ගැන සභාව සැලකිළිමත් වන ලෙස දන්වා ඇති බවත් එනිසා පසුගිය දේවල් ගැන ඉදිරියට ක්‍රමානුකූලව වෙනමම පරීක්ෂණ කල යුතු බවත් වාහන ධාවනය සඳහා යෙදවීමට කටයුතු නල යුතු බවත් නමුත් හිතුමතේට වාහන රගෙන යන බවත් ඒ ගැන සොයා බැලිය යුතු බවත් අයථා වාහන භාවිතය සම්බන්ධව ඔප්පු වී ඇති බවත් මෙම වාහනයේ තිබුණු එන්ජිම කැඩුනු එක ඉතා හොද බවත් එනිසා බොරු වාර්තා සියල්ල ඔප්පු වී ඇති බවත් මෙයට අප 43 දෙනාම වගකිව යුතු බවත් සඳහන් කරන ලදි.

<u>ගරු A.H.A රත්නායක මන්ත්‍රීතුමා</u>

තකර් විතකර් ගණනාවක් ගෙන ආවත් වාහනය 147510KM ධාවනය කර ඇති බවත් මෙම යුනයිටඩ් මෝටසර් ආයතනයේ ඇස්තමේන්තු තමා පිළිනොගන්නා බවත් මෙය තනිකරම වංචාවක් බවත් ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය තමාද පිළිගන්නා බවත් ඒ තකර්ය මත මෙම වාහනය අපට ගාල්කර තැබිය නොහැකි බවත් එනිසා ගරු ශාන්ත මන්ත්‍රීතුමා සඳහන් කල පරිදි අපේ ලියාපදිංචි ආයතන වලින් මේ සඳහා ඇස්තමේන්තු කැඳවිය යුතු බවත් තමාද මෙවන් වාහන සිද්ධියකට මුහුණ දුන් බවත් පරීක්ෂණයේදී ඔයිල් බැලුවාද යන්න විමසූ බවත් එහිදි ආයතනයේ නිළධාරි මහතාට තෙල් මට්ටම පෙන්වා ගමන ගිය නිසා මහදි ඔයිල් මට්ටම නොබැලු බව පැවසූ බවත් එනිසා වාහනයට එන්ජිමක් දුන් බවත් නමුත් යුනයිටඩ් මෝටසර් යනු ඉතාම නරක ආයතනයක් බවත් මේ සඳහා පරීක්ෂණයක් සිදුකල යුතු බවත් ඒ අතරතුර අපි මෙම වාහනය අළුත්වැඩියා කරගත යුතු බවත් අපි සියළු දෙනාම කමිටු වාර්තා සියල්ල අනුමත කරන බවත් නමුත් මෙහි පරස්පර දේවල් තිබෙන බවත් අපි සියළු දෙනා ඒ සඳහා වගකිව යුතු බවත් මෙම මහජන මුදල් බැවින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමාට කිසිම ගැටළුවක් නොමැති බවත් තමා කිසි දිනක යුනයිටඩ් මෝටසර් ආයතනයට ගොස් නොමැති බවත් මෙම ආයතනයට වාහන ගෙන ගිය පසු ගේට්ටුවෙන් ඇතුළට යාමට අවස්ථාව නොදෙන බවත් අනතුරුව ගේට්ටුවෙන් එළියට වාහනය ගෙන එන බව පවසන බවත් තමා වාහන වල මීටර් නොබලන බවත් සඳහන් කරන ලදි.

ගරු දිනුක රත්නායක මන්ත්‍රීතුමා

සියළුම සවරීස් එක අපට බලාගත හැකි බවත් ඒ සම්බන්ධයෙන් වාහනය රැගෙන යන කෙනාට වගකීමක් ඇති බවත් සඳහන් කරන ලදි.

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

මුලින් ගෙන ආ යෝජනාවට අනුව වාහනය අළුත්වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරන බවත් අතුරු යෝජනාවක් ලෙස අදාල යුනයිටඩ් මෝටසර් ආයතනයට මෙම වාහනය පිළිබඳව වගකීමක් තිබෙන නිසා එම අයගේ වගකීම තහවුරු කිරීම පිණිස 50% වත් මුදලක් වාහනය සඳහා ගාස්තු අය කිරීමේදී අඩු කර අයකර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

මේ ආයතනයෙන් අපට වගකීමක් නොදෙනවානම් එම අය නිවැරදි ඇස්තමේන්තු එවා තිබුනානම් ගැටළුවක් නොමැති බවත් රු. 60000.00වගේ වැඩි මුදලකට සේවා කිරීම් කර තිබියදීත් වෙනත් ආයතනවලින් . 20000.00 වගේ අඩු මුදලකට සේවා කටයුතු කිරීමට අවස්ථාව තිබියදීත් එසේ නොකරනවා නම් එම ආයතනයේ සේවය පිළිබඳව සමාගම දැනුවත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

වාහනය අළුත්වැඩියා කරනවා නම් අළුතින් ඔයිල් පොම්පයක් දමනවාද නැද්ද යන්න විමසන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 .1 (3)

5(1.3) උඩපළාත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මහනුවර අභියාචනා මහාධිකරණයේ විභාග වන නඩු අංක ප්‍රති 27/20 දරණ නඩුව සඳහා 2021.07.12 දින පෙනී සිටීම වෙනුවෙන් රු.7500.00ක මුදලක්ද ලිඛිත ලේඛන සැකසීම සඳහා රු.15000.00 මුදලක්ද නීතිඥ ගාස්තු ලෙස නීතිඥ යූ.ඒ.බෝගහපිටිය මහතාට ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා

ගෙවීම් කටයුතු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>තීරණ අංක 05 .1 (4)</u>

5 (1.4) සංචරණ සීමා පැවැති කාලයේ එනම් 2021.05.21 දින සිට 2021.06.21 දින දක්වා බිල් කරන ලද කඩ කාමර වල කුළී මුදල් රු.306404.48 සහ පොදු වැසිකිළිය බිල් කිරීම රු.3875.00ද එකතුව මුළු මුදල වන රු.310279.48 ලේඛණවලින් කපා ඉවත් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු උප සභාපති අසේල අමරසේන මහතා**</u>

විශේෂයෙන් පුස්සැල්ලාව ප්‍රදේශයේ මෙන්ම සෑම ප්‍රදේශයකම කඩ හිමියන් කථා කර මෙම කාරණය ඉදිරිපත් කරන බවත් පසුගිය කොරෝනා වසංගත කාලය තුළ ව්‍යාපාර ක්ෂේත්‍රයේ කටයුතු අඩාල වූ නිසා කඩ කුළී ගෙවීමට අපහසුතාවයන් තිබෙන බැවින් කඩ කාමර කුළී මුදල හා පොදු වැසිකිළිය බිල් කිරීම සඳහා වන රු. 310279.48 ක මුදල ලේඛන වලින් කපා හැරීමේ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 .1 (5)</u>

5(1.5)උඩපළාත ප්‍රාදේශීය සභාවට අයත් දැල්පිටිය සායන මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල ඉදිකිරීමට අවසර ඉල්ලා උඩපළාත සෞඛ්‍යය වෛද්‍ය නිළධාරි ඉදිරිපත් කර ඇති ලිපිය මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**</u>

අපේ සභාවේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලෙස සඳහන් කරමින් මෙම යෝජනාව මම ස්ථිර කරමි.

<u>***ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා***</u>

මෙයට කළින් ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් ලක්ෂ 10ක මුදලක් වියදම් කර සංවධර්නය කල බවත් නමුත් ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට එම ගොඩනැගිල්ල අයිති නොවූ බවත් සඳහන් කරන ලදි.

<u>**ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා**</u>

අපේ එකඟතාවය මේ සඳහා ලබා දෙන අතරේ මෙහි අධීක්ෂණ කටයුතු උඩපළාත ප්‍රාදේශීය සභාව මඟින් සිදු කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලෙස සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 .1 (6)

5 (1.6)උඩපළාත ප්‍රාදේශීය ලේකම් කායර්ාලය හා දොළුව ප්‍රාදේශීය ලේකම් කායර්ාලය මගින් සිදු කරන COVID19 එන්නත්කරණ වැඩසටහන් සඳහා අවශ්‍ය සංග්‍රහ සහ අනිකුත් වියදම් වෙනුවෙන් රු.300000.00ක පමණ මුදලක් වැයකිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

දොළුව,උඩපළාත ප්‍රාදේශීය ලේකම් කායර්ාල මගින් සංවිධානය කරන ලද COVID19 එන්නත්කරණ වැඩසටහන් සඳහා සංග්‍රහ වියදම් හා වෙනත් අත්‍යවශ්‍ය සේවා සඳහා රු.500000.00 ක මුදලක් ලබාදීම සුදුසු බවත් තවත් මුදල් අවශ්‍ය වූවොත් ආවරණ අනුමැතියට යටත්ව මුදල් යෙදවීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 .1 (7)

5 (1.7)සභාව සතුව තිබූ ගම්පොල නගර සභාව වෙත පවරා ඇති වත්කම් වත්කම් ලේඛණයෙන් ඉවත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

සභාව සතුව තිබූ ගම්පොල නගර සභාව වෙත පවරා ඇති වත්කම් වත්කම් ලේඛණයෙන් ඉවත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 .1 (8)

5 (1.8) ඩිජිටල් පුස්තකාල සංවධර්න ව්‍යාපෘතිය යටතේ දොළුව මහජන පුස්තකාලය ඩිජිටල් පුස්තකාලයක් ලෙස සංවධර්නය කිරීම යටතේ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත .ඒ යටතේ පුස්තකාලයේ (1.) CCTV කැමරා පද්ධතියක් සවි කිරීම,(2.) පාඨක පිරිස ආකෂර්ණය කර ගත හැකි පරිදි පුස්තකාල භූමිය අලංකාරකරණය කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

දොළුව නගරයේ සියළු රාජ්‍ය ආයතන පවතින බවත් දොළුව පුස්තකාල ගොඩනැගිල්ලේ උඩු මහළ අලංකාර ලෙස සකස් කර පරිසනක මධ්‍යස්ථානයක් ඉදිකරන බව සදහන් කල බවත් එහිදි උඩපළාත බල ප්‍රදේශයේ දොළුව, මුල්ගම, ලැගුම්දෙණිය, පන්විලතැන්න, හල්ඔය, ගල්ඔය, වාරියගල, කහවත්ත ප්‍රදේශ වල ජීවත් වන අපේ දරුවන්ට පරිසනක පාඨමාලා පුහුණුව නොමිලේ ලබාදීමට කටයුතු කිරීම ඉතා වටිනා බවත් පරිසනක ක්ෂේත්‍රය ඉදිරියේදී ඉතා අත්‍යවශ්‍ය වන බවත් අපේ අසරණ දුප්පත් දරුවන්ට පාඨමාලා හැදෑරීමට මහ පෙන්වීමක් නොමැති නිසා ඒ ඒ ප්‍රදේශවල මන්ත්‍රීවරුන්ට දරුවන් දැනුවත් කර මෙම ස්ථානයට යොමු කිරීමට කටයුතු කරන ලෙසත් ඉල්ලීමක් කරන ලදී.මෙහිදි රාජ්‍ය අනුග්‍රහය ඇතිව සහතිකයක් නිකුත් කරන බවත් එය ඉතා වටිනා කාරණයක් බවත් මුදල සදහන් නොමැති වුවත් ඇස්තමේන්තුවක් ඉදිරියේදි ඉදිරිපත් කරනු ඇතැයිද මේ සම්බන්ධයෙන් සම්පූණර් සහයෝගය ලබා දෙන බවත් මෙවන් උපකාර කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලයට ස්තුතිවන්ත වන බවත් සදහන් කරමින් මෙම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

පුස්තකාල සේවා සැපයීමේදී දොළුව මහජන පුස්තකාලය නවින පන්නයේ පුස්තකාලයක් ලෙස ඩිජිටල්කරණය වන බවත් දිස්ත්‍රික්කයකට එක් පුස්තකාලය බැගින් මෙලෙස ඩිජිටල්කරණයට පත් කරන බවත් ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය සභාවේ දොළුව පුස්තකාලය තෝරාගැනීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත් අපි සභාවක් ලෙස සතුටු වන බවත් යෝජිත අංග සම්පූණර් පුස්තකාලය සියළු අංගෝපාංග සහිතව සභාව මගින් ලබාදීමටත් ඉදිරිපත් කර ඇති අවශ්‍යතා සහිතව දොළුව පුස්තකාලය සංවධර්නය කිරීමට සම්පූණර් සහයෝගය ලබාදෙන බවත් උඩපළාත බල ප්‍රදේශයේ පාඨකයින්ට මෙය මහඟු අවස්ථාවක් බවත් ඒ අනුව අපි ඉතා හොද පුස්තකාල පහසුකම් පාඨකයින්ට ලබාදෙමු යැයි සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 .1 (9)</u>

5 (1.9)දොළුව වෙළද සංකීණර්යේ උඩු මහල දොළුව ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට විදාතා මධ්‍යස්ථානය සදහා තක්සේරු වටිනාකමට ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

විදාතා මධ්‍යස්ථානය පැවතීම හොද බවත් නමුත් දොළුව වෙළද සංකීණර්ය පසුගිය කාලයේ තමාගේ යෝජනාවකින් විශාල මුදලක් වැය කර දොරවල් දමා සිවිලිම් ගසා සභාවෙන් සංවධර්නය කල බවත් නමුත් මෙය විය යුතු කටයුත්තක් වුවත් අපි ටෙන්ඩර් පටිපාටියට ගිය පසු එම අයට ටෙන්ඩර් මගින් මෙම ගොඩනැගිල්ල ඉල්ලුම් කරගත හැකි නම් ඉතා වැදගත් බවත් රු.250.00 - 300 .00 මුදල් වලට මෙම කඩ කාමර ලබාදීමට අවශ්‍ය නොවන බවත් ලක්ෂ 50-60 දැනට මේ ස්ථානය සදහා වියදම් කර ඇති බවත් දොළුව වෙළද සංකීණර්ය ඉදිරියේදී සභාවට ආදායම් ලබාගැනීමට රුකුළක් වන බවත් එනිසා සම්පූණර්යෙන් තමා මේ සදහා විරුද්ධ වන බවත් දොළුව ප්‍රදේශයේ විශාල පිරිසක් මෙහි කඩ කාමර ලබාගැනීමට

බලාපොරොත්තු වන බවත් එනිසා ආදායම් අංශයේ නිළධාරින් විසින් දැනට තක්සේරු කල වටිනාකමට අනුව කඩ ලබාදීමට කටයුතු කරන ලෙසත් විදාතා මධ්‍යස්ථානයක් සඳහා ඉල්ලුම් කල අයට ලිපියක් යොමු කර තක්සේරු කරන නිසා එම තක්සේරු මුදලට ඉල්ලීම් යොමු කරන ලෙස දන්වා යවන ලෙස සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

තක්සේරු දෙපාතර්මේන්තුවෙන් තක්සේරු මුදල තීරණය කරන බවත් ඉල්ලුම් කරන්නේ රජයේ ආයතනයක් නිසා ටෙන්ඩර් ක්‍රමයකින් තොරව තක්සේරු මුදලට ලබාදීමට තමා යෝජනා කල බව සඳහන් කරන ලදි.

**<u>ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා</u>**

මෙය මහජන සේවාවක් බවත් එනිසා ටෙන්ඩර් කිරිමකින් තොරව තක්සේරු මුදලට යා යුතු බව මම යෝජනා කරමි.

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

ගරු මන්ත්‍රීතුමන්ලා නිතරම සභාවට ආදායම් ලැබිය යුතු බවට යෝජනා කරන බැවින් ඒ අරමුණ ඇතිව දොළුව වෙළඳ සංකීණර්ය සභාව මඟින් නවීකරණය කල බවත් එනිසා එම වෙළඳ සංකීණර්ය විදාතා මධ්‍යස්ථානයට දීමට අපගේ විරුද්ධත්වයක් නොමැති බවත් මෙය ළමයින්ට කරන සේවාවක් බවත් නමුත් ඒ සඳහා වෙනත් ස්ථාන සොයා ගත හැකි බවත් දොළුව වෙළඳ සංකීණර්ය ලබා දෙනවා නම් රජයේ තක්සේරුවට අනුව උචිත වටිනාකමට ලබා දෙන ලෙසට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

එම අයගේ ඉල්ලීමට අනුව තක්සේරු දෙපාතර්මේන්තුවෙන් පැමිණ බැලූ බවත් නිතර නිතර කථා කර හදිසි නිසා ස්ථානය ඉල්ලා සිටින බවත් මෙම අය වගර් අඩි 1000ක ප්‍රමාණයක් ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදි.

**<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>**

දොළුව වෙළඳ සංකීණර්යේ කඩ කාමර ගැනීමට වෙළඳ ප්‍රජාව බලාපොරොත්තු වන බවත් එනිසා ටෙන්ඩර් වලින් විදාතා මධ්‍යස්ථානයට අවශ්‍ය නම් ලබාගන්නා ලෙස සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මහ සභාවේ මුදලින් වෙළඳ සංකිණර්ය අළුත්වැඩියා කල බවත් එනිසා තනි තීරණ නොගෙන රජයේ ආයතනයකින් මෙම ඉල්ලීම කල නිසා තමා සභාවට යොමු කල බවත් ගරු උප සභාපතිතුමා මේ සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කල නිසා මහ සභාවේ තීරණය ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

***<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>***

අලෙවිය සඳහා ඉල්ලීම් කරන නිසා කඩ කාමර 2ක් පමණ විදාතා මධ්‍යස්ථානයට ලබා දෙමු යැයි පවසන ලදි.මෙම අය විදාතා මධ්‍යස්ථානයෙන් පුහුණු කර නිෂ්පාදනය කරන භාණ්ඩ අලෙවිය සඳහා ඉල්ලා සිටිනවා නම් එයද ව්‍යාපාරයක් බවත් එනිසා අපි මේ අයට උපකාරයක්

ලෙස 12ක් තිබෙන කඩ කාමර වලින් කඩ කාමර 2ක් ටෙන්ඩර් පටිපාටියෙන් තොරව රජයේ තක්සේරුවට ලබා දෙන ලෙසට මම යෝජනා කරමි. එසේ නොමැතිව තවත් කඩ කාමර අවශ්‍ය නම් එම අයට ටෙන්ඩර් පටිපාටියෙන් ලබා ගන්නා ලෙසත් යෝජනා කරන ලදි.

<u>**ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා**</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.දොළුව පහළ විද්‍යාතා මධ්‍යස්ථානයක් තිබෙනවා නම් ගොඩනැගිලි 2ක් කුළියට ගැනීමට රජයේ මුදල් වෙන් නොකරන ලෙස සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 .1 (10)</u>

5 (1.10) ප්‍රාදේශීය සභා පනතේ 168(1) රීති ප්‍රකාරව වෂර්ය ඉකුත් වීමට පෙර ඉදිරි වෂර්ය සඳහා අයවැය ලේඛනයක් සකස් කර සභාවට ඉදිරිපත් කර අනුමත කරවා ගැනීම සඳහා එසේ සකස් කර ගන්නා වූ අයවැය ලේඛනය කාල සටහනක් මඟින් සකස් කර ගැනීමට අපේක්ෂා කරන අතර එම කාල සටහන අනුව නියමිත දිනට ඔබගේ අදහස් සහ යෝජනා ලිඛිතව ලබා ගැනීමටද අදහස් කරන අතර මෙම මාණ්ඩලික පත්‍රය සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 .1 (11)</u>

5 (1.11) RD-1613 ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියාවක් ඇති බවට රියදුරු විසින් දැන්වීමෙන් අනතුරුව සභාව මඟින් දැන්වූ පරිදි මහනැගුම මාගර් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත අළුත්වැඩියාව සඳහා යොමු කරන ලදි.ඒ අනුව එම ආයතනය විසින් රථය ගලවා පරීක්ෂා කර අළුත්වැඩියාව සඳහා රු.93,790.44 ක මුදලක් ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති බැවින් එම මුදල වැය කර රථය අළුත්වැඩියා කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

කමර්ාන්ත අනුමැතිය

කමර්ාන්ත යෝජනා

ගරු සභාපතිතුමාගේ යෝජනා

5(1.12) මස්ගොල්ල වසමේ හිටපු ග්‍රාම නිළධාරි බී.ජී.ධමර්සේන මහතාගේ නිවස අසළ සිට එච්.ජී.සුහසිංහ මහතාගේ නිවස අසළ දක්වා වූ මාගර්ය කැපීම සඳහා රු.200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5(1.13) කහවත්ත හරහා ග්‍රෝහිල් මාගර්ය පිලිසකර කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

5(1.14) ඩිජිටල් පුස්තකාල සංවධර්න ව්‍යාපෘතිය යටතේ දොළුව මහජන පුස්තකාලය ඩිජිටල් පුස්තකාලයක් ලෙස සංවධර්නය කිරීම ඇස්තමේන්තු ගත මුදල රු.1280000.00 ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5(1.15) යාමිල්ල වාරියගොඩ මාගර්ය සංවධර්නය කිරීම සඳහා යෙදූ රු.300000.00 කමර්ාන්තය වෙනුවට

1)ගොනවුවෙල එල්.ආර්.සී කොටසේ සුජීව මහතාගේ නිවස අසළ බෝක්කුව සෑදීම රු.150000.00 සහ

2) කාසල් මිල්ක් නැඩිසා ගොවිසෙවණ අසලින් පහළ මාගර්ය සංවධර්නය කිරීම රු.150000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5(1.16) නාගශ්‍රී බෝධි විහාරය අසලින් අම්බළම හරහා මහරවෙළ මාගර්ය ගිලාබැස ඇති ස්ථානය සංවධර්නය කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

5(1.17) නාගශ්‍රී බෝධි විහාරය අසලින් අම්බළම හරහා මහරවෙළ මාගර්යේ පටු පාළම අත්වැට දමා වැඩි දියුණු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

5(1.18 )මහරවෙළ පැරණි පාළම ගලවා ඉවත් කර එම පාළම වැඩි දියුණු කිරීම යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5(1.19 )අමුනුපුර වසමේ මහර නැඩිසා ජනපදයට යන පාරේ වැසි ජල කානුව සංවධර්නය කිරීම 350000.00 ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සුප්පයියා ජීවා මන්ත්‍රීතුමාගේ යෝජනා

5 (2.1) වහුගපිටිය ජයතුංග කඩේ අසළ සිට පහළට යන මාගර්යේ ධනරාජ් මහතාගේ නිවස දක්වා මාගර්ය සංවධර්නය කිරීම සඳහා රු.350000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2 .2) වහුගපිටිය පිහිල්ල අසළ ඇති සාෆි මහතාගේ නිවසට යන මාගර්ය සංවධර්නය කිරීම සඳහා රු.150000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.3) වහුගපිටිය රාජපක්ෂ මහතාගේ නිවස අසළ සිට පෝල් මහතාගේ නිවස දක්වා මාගර්ය සංවධර්නය කිරීම සඳහා රු.200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සුභද්‍රා සමරනායක මන්ත්‍රීතුමියගේ යෝජනා</u>

5 (2.4) හපුගස්පිටිය ජනකලා කේන්ද්‍රය අසළින් වනවාස විහාරයට යන මාගර්යේ ප්‍රියංකා මහත්මියගේ නිවස අසළ සිට වනවාස විහාරය දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරිම රු.300000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්තයක් ලෙස

හපුගස්පිටිය යකඩාදෙණිය පාළම අසළ සිට ජී.ඒ.අබේරත්න මහතාගේ නිවස දක්වා මාගර්ය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු චමිලා ෆොන්සේකා මන්ත්‍රීතුමියගේ යෝජනා</u>

5 (2.5) මිල්ලගස්පිටිය වසමින් ආරම්භ වී මැදගම මැද්ද දක්වා මාගර්ය සංවධර්නය කිරීම රු.100000.00 කමර්ාන්තය එකේ කණුව මාගර්ය පාළම සංවධර්නය කිරීම රු.100000.00 කමර්ාන්තය හා කලවැල්ල මාගර්යේ ඇති නාන පිහිල්ල සංවධර්නය කිරීම රු.100000.00 වෙනුවට සංශෝධන කමර්ාන්තයක් ලෙස

නෙල්ලි ගොල්ල මාගර්යේ සමන් මහතාගේ නිවස අසල සිට ඉදිරියට වැටී ඇති මාගර්ය සංවධර්නය කිරීම රු.300000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ඉදිරිපත් කර ඇති සියළුම කමර්ාන්ත යෝජනා සහ සංශෝධිත කමර්ාන්ත යෝජනා ඉටුකිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

5(1.19)අමුනුපුර වසමේ මහර නැඩිසා ජනපදයට යන පාරේ වැසි ජල කානුව සංවධර්නය කිරීම 350000.00 කමර්ාන්තය ගියවර මහ සභාවේ සම්මත වී ඇති බැවින් මෙම යෝජනාව ඉවත් කරන ලෙස සදහන් කරන ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

නාගශ්‍රී බෝධි විහාර පාරේ දෙපස වල් වැදී අඩි 10 මාගර්ය අඩි 8ට අඩු වී ඇති බවත් එම මාගර්යේ ගමන් කල නොහැකි බවත් එනිසා මෙම මාගර්ය පහළට සංවධර්නය කරන ලෙසත් තුන් වරක් මෙම මාගර්ය සංවධර්නය කලත් කැඩී ගිය බවත් එනිසා මෙම මාගර්ය කවුරු හෝ මන්ත්‍රීවරයෙකුගේ නමින් අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලෙසත් අපට ඒ ප්‍රදේශ වලට යාමට අපහසුතාවයක් දැනෙන නිසා ඒ ප්‍රදේශයේ සිටින මන්ත්‍රීවරයෙකුගේ නමින් යෝජනාව දමා අගල් 5ට කොන්ක්‍රීට් දා සංවධර්නය කරන ලෙසත් මෙයට පෙර අගල් 2ට කොන්ක්‍රීට් දමා මැද උස්සා සංවධර්නය කර මුදල් අවභාවිතා කල බව ජනතාව පැවසූ බවත් සදහන් කරන ලදි.

ගරු රුවන් දසනායක මන්ත්‍රීතුමාටද මුදල් ප්‍රතිපාදන ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. සභාවට මන්ත්‍රීවරයෙකු ලෙස පත් වූ පසු එම මන්ත්‍රීවරයාටද මුදල් ලබාදීම අපගේ යුතුකමක් බවත් සදහන් කරන ලදි.එසේම ඉදිරිපත් කර ඇති සියළුම කමර්ාන්ත යෝජනා සහ සංශෝධිත කමර්ාන්ත යෝජනා ඉටුකිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මෙවර ලක්ෂ 07 බැගින් අපහසුතාවයෙන් යුක්තව ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන ලබාදුන් බවත් නමුත් මන්ත්‍රිවරු මාරු වන සෑම විට මුදල් ලබාදීමට හැකියාවක් නොමැති බවත් එලෙස කටයුතු කලොත් එය ගැටළුවක් බවත් සභාවේ ආදායම් තත්වය ගැන ඔබතුමන්ලා දන්නා බවත් මේ වසරේ සභාවට ආදායමක් ඇත්තේම නැති බවත් තමා මුදල් දීමට නොහැකි බව නොපවසන බවත් ඒ සම්බන්ධයෙන් අපි නිවැරදිව සලකා කටයුතු කල යුතු බවත් ගිය වසරේ මුදල් නොමැති නිසා සියළු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 3 බැගින් ප්‍රතිපාදන ලබාදුන් බවත් සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

නාග ශ්‍රී බෝධි විහාර පාර ගැන කතා කිරිමේදි මීට පෙර මෙම මාගර්ය විශේෂ යෝජනාවක් ලෙස සංවධර්නය කිරිමට යෝජනා කල බවත් අපි ලක්ෂ 40ක මුදලක් වෙන් කර මැද ගම්මැද්ද සිට දෙණියේගම දක්වා මාගර්ය සෑදීමට මුදල් වෙන් කල බවත් නමුත් පසුගිය රජයෙන් මෙම මාගර්ය සංවධර්නය කිරිමට මුදල් වෙන් කල නිසා අපි මිල්ලගහමුල මාගර්ය සංවධර්නය කල බවත් එනිසා දැන් නාගශ්‍රී බෝධි විහාර මාගර්යේ ගමන් කිරීමට නොහැකි තත්වයක් උදා වී ඇති බවත් මේ වන විට කාපට් ව්‍යාපෘති ලක්ෂය යටතේ මෙම මාගර්ය කාපට් දැම්ම සඳහා ටෙන්ඩර් කර ඇති බවත් එසේම කලවැල්ගොල්ල මාගර්ය මාගර් සංවධර්න අධිකාරිය හරහා ආරම්භ කල බවත් මිල්ලගහමුල සිට දෙණියේගම මාගර්යත් ටෙන්ඩර් කර ඇති බවත් එම කටයුතු අවසන් කල වහාම එම මාගර්යේ කටයුතු ආරම්භ කරන බවත් මහරවෙල අම්බලම පාලම විශේෂ ව්‍යාපෘතියක් යටතේ ආරම්භ කල යුතු බවත් දැනට මෙම පාළම කැඩී වසර 32ක් පමණ ගල වන බවත් 1991 වසරේ සිට මේ දක්වා මෙම කමර්ාන්තය ඉටු කිරීමට නොහැකි වු නිසා ආරම්භ කල ව්‍යාපෘති වලින් පළමුවෙන්ම මෙම පාළමේ කටයුතු අවසන් කල යුතු බවත් පාළමේ බැමි දෙක කොටස් වශයෙන් හෝ ගලවා වැල්ඩින් කර හෝ සවිකිරීම කල යුතු බවත් මෙම පාළම සංවධර්නය කරමු යැයි යෝජනා කරන ලදි.මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම ගැන ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වන බවද සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මෙහි ගොවි ජනතාවට සිය නිෂ්පාදන අලෙවි කර ගැනීමට යාමට නොහැකි තත්වයක් උදා වී ඇති නිසා පරණ පාලමේ අත්වැට ගලවා සවි කරන බව සඳහන් කරන ලදි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

මේ වන විට කාපට් කරන මාගර් ගැන සොයා බලා එම මාගර් සඳහා අපේ සභාවේ මුදල් නොයොදවන ලෙසත් නැත්නම් එම මුදල් නාස්ති වන බවත් දොළුව,නාරංවිට සහ තමාගේ ගමේ බින්විනෝ පාරටද එසේ වූ බවත් තමා ගරු උප සභාපතිතුමා සමඟ සමහර ගම් වලට යන බවත් එවිට අපේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා සිටින තැන්වල ගම් සභා පාරවල් වල වල් ටිකවත් ගසා දමා නොමැති බවත් වල් ටිකවත් ගසා දමා එළි පෙහෙළි කිරීමට ඔවුන් මැදිහත් නොවන බවත් ගරු සභාපතිතුමා කම්කරුවන් බෙදා ලබා දෙන බවත් එනිසා එතුමාට කථා කර මෙම කටයුතු ඉටු කරගන්නා ලෙසත් අපේ සභාවේ කමර්ාන්ත කමිටුව තිබූ බවත් කමර්ාන්ත ගිවිසුම් අත්සන් කිරීමේදී ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ගිවිසුම් ගාස්තු නොගෙවා මුද්දර ගාස්තු නොගෙවා අවශ්‍ය ලිපි ලේඛන නොමැතිව ගිවිසුම් අත්සන් කරන බවත් එහිදි ලේකම්තුමිය ප්‍රධාන කායර්භාර නිළධාරින් අපහසුතාවයට පත් වන බවත් මේ සම්බනධයෙන් පළාත් සභාවෙන්ද ලිපි එවු බවට තමාව දැනුවත් කල බවත්

එනිසා සියළුම කටයුතු අවසන් කර ගිවිසුම් අත්සන් කරන ලෙසට සියළු දෙනා මේ සම්බන්ධයෙන් දැනුවත් කරන බවත් උඩපළාත බල ප්‍රදේශයේ විශාල සංවධර්න වැඩසටහන් සභාව මඟින් කරගෙන යන බවත් ඒ සම්බන්ධයෙන් අපේ ගරු මන්ත්‍රී මණ්ඩලය සොයා බලා කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

නාග ශ්‍රී බෝධි විහාර පාර අපි කොන්ක්‍රීට් කරන බවත් පාළම විශාල ලෙස අළුත්වැඩියා කිරීමට මුදල් නොමැති බවත් තිබෙන අත්වැට ගලවා සවි කරන බවත් (ලොකු පාළමක් නොහදා) අලිවල ලඟ වාහනයක් ගැනීමට නොහැකි නිසා සංවධර්නය කල යුතු බවත් මෙම මාගර්ය බැලීමට ලේකම්තුමිය, කාමරීක නිළධාරි හා තමා ගිය බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව* මහ සභාව *තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

**(6) කාරක සභා වාථර්ා ඉදිරිපත් කිරීම**

1. 2021 ජුනි මාසයට අදාළ ධාවන සටහන් වාථර්ා ඉදිරිපත් කිරීම

2. උඩපළාත ප්‍රාදේශීය සභා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ාව 2021.07.09

3.2021/07/15 දින කමර්ාන්ත කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

මෙතෙක් කල් අසත්‍ය වාථර්ා සම්මත කර ගත් බව පැවසු බවත් නමුත් තමා කිසි දිනක මීටර් පරීක්ෂා නොකල බවත් ඉදිරියේදි තමා වාහනයේ දිනට අදාළ මීටරය සටහන් කරගන්නා බවත් මෙය කාගේ වරදක්ද නොදන්නා බව සඳහන් කරමින් ඉහත සඳහන් කමිටු වාථර්ා සියල්ල පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

ඉහත සඳහන් කමිටු වාථර්ා සියල්ල පිළිගැනිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව* මහ සභාව *තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

**(7) ආදායම් වියදම් වාථර්ා ඉදිරිපත් කිරීම -**

2021 මැයි හා ජුනි මාස වල ආදායම් වියදම් වාථර්ා හා ආදායම් ප්‍රගති වාථර්ා මහ සභාවට ඉදිරිපත් කරමින් 2021 මැයි හා ජුනි මාස වල ආදායම් වියදම් වාථර්ා හා ආදායම් ප්‍රගති වාථර්ා පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

මැයි ජූනි මාස වලට අදාළව ආදායම් වියදම් වාර්ථා දෙකක් ඉදිරිපත් කර ඇති බවත් අප්‍රේල් මාසයේ ආදායම් වියදම් වාර්ථාව ඉදිරිපත් කරන විට ඉදිරි මාස දෙක තුළ මේ සභාවේ ආදායම් තත්වය කෙසේ වේද කියා ඉඟියක් පල කල බවත් එහිදි අපි සභාවේ කටයුතු කරගෙන යන ක්‍රමවේදය ඉතා පැහැදිලිව නිගමනය වන බවත් මැයි මාසයේ ආදායමට සාපේක්ෂව ලේඛනය බැලූකල වැඩිම ආදායමක් සහිත වාර්ථාවක් ඉදිරිපත් වී ඇති බවත් මීට ඉහත මාසයේ ගත් තීරණයකට අනුව බහුකායර් ගොඩනැගිල්ල ඉදිකිරිමේ කටයුතු සඳහා කෝටි 5ක මුදලක් ස්ථාවර තැන්පතුවක් ලෙස තැන්පත් කර ඇති බවත් ඒ අනුව රු.61,542,518.78 වැයක් පෙන්නුම් කර ඇති බවත් මැයි මාසයේ සැබෑවටම බැලූ කල මෙම මුදල වැයක් ලෙස පෙන්නුම් කරන විට ඌනතාවය ලෙස රු.59,675,364.07ක මුදලක් පෙන්නුම් කරන බවත් කෝටි 5ක මුදලක් ස්ථාවර තැන්පතුවක් ලෙස තැන්පත් කලත් ඒ මුදල ඉවත් කලත් එම මාසයේ සැබෑම ආදායම ලෙස රු.1,867,254.71 ආදායමක් එම මාසයට ඇති බවත් වියදම ලෙස රු.61,542,518.78 වන බවත් නමුත් රු.96,752,64.79 එම මාසයේ ආදායමට සාපේක්ෂව සඳහන් බවත් ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන වැය සඳහා රු.2,862,619.02 වියදම් වී ඇති බවත් ණයහිමි ගෙවීම් ලෙස රු.2,145,171.94 සඳහන් බවත් වැටුප් හා දීමනා වෙනුවෙන් රු.4,622,390.99 ද ගමන් වියදම් ලෙස රු.80,997.00 ද සැපයුම් හා උපකරණ ලෙස රු.194,449.00 සඳහන් බවත් ගරු මන්ත්‍රීවරුන්ගේ ඉන්ධන දීමනා ලෙස රු.154,000.00 සඳහන් බවත් වත්කම් හා අළුත්වැඩියා යටතේ රු.233,552.00 වියදම් කරන විට අපට ආදායම ලෙස රු.1.867,254.71 ලැබෙන බවත් මුදල කුමක්ද යන්න අපට සිතෙන බවත් මීට පෙර සඳහන් කල පරිදි වැඩි ඌනතාවයකට ලක් වන බව සඳහන් කල බවත් පෙර වෂර් වල කරගෙන ආ වැඩ පිළිවෙළ සාර්කත්වය උඩ අපට මෙම අමාරු කාල සීමාව ගෙවා ගැනීමට හැකි වී ඇති බවත් සංවධර්න වැඩ කටයුතු සඳහා රු.ලක්ෂ 54කට වඩා වැඩි මුදලක් වියදම් කර රු.1,867,254.71 ක අඩු ආදායමක් ලබා ගෙන සංවධර්න කටයුතු මෙන්ම ජනතාවට සේවා සපයමින් කටයුතු කිරීම සම්බන්ධයෙන් උඩපළාත ප්‍රාදේශීය සභාව ලෙස අප සතුටු විය යුතු බවත් අපි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කල යුතු බව ගරු මන්ත්‍රීවරුන් සඳහන් කල බවත් එනිසා සභා දේපළ යම්කිසි ආදායමක් ලැබෙන පරිදි කටයුතු කරමු කියා අදහස් ගෙන ආ බවත් තවද අපි ජනතාවට ගරු මන්ත්‍රී මණ්ඩලය හරහා සංවධර්න යෝජනා වෙනුවෙන් රු.ලක්ෂ 50ක මුදලක් වෙන්කර ඇති බවත් සඳහන් කරමින් මැයි මාසයේ ආදායම් වියදම් වාර්ථාව මම ස්ථිර කරමි.

ජූනි මාසයේ ආදායම ලෙස රු.9,662,671.64 ලෙස පෙන්වන බවත් එම මුදල වියදම් වල විට රු.1,103,005.25ක අතිරික්තයක් පෙන්වන බවත් පසුගිය මාස දෙකෙහිම පරිපාලන ප්‍රතිපූණර් සඳහා රු.8,202,971.70ක මුදලක් ලැබී ඇති බවත් එම මුදල් අපට මධ්‍යම රජය මඟින් නොලැබුණා නම් රජයේ සේවකයින්ගේ පඩි නඩි හා අපේ වැටුප් හා වේතන ගෙවා ගැනීමට නොහැකි වන බවත් සභාව ලෙස අපි රු.1,415,837.74ක ආදායමක් ලබාගෙන ඇති බවත් පෙර මාසයට වඩා තවත් ආදායම අඩු වී ඇති බවත් ඒ අනුව මෙයාකාරයට ආදායම් තත්වය පවත්වා ගෙන යාමට ගරු සභාපතිතුමා ඇතුළු අපේ කායර් මණ්ඩලය ගන්නා වූ උත්සාහය අගය කල යුතු බවත් අද දින සභාවේදී රටේ පවතින වසංගත තත්වය මත කඩ කුළී ගෙවීම් ලෙස රු.310,279.48 ලේඛන වලින් කපා හැරිය බවත් ලබන මස ආදායම තවත් පහළ තත්වයකට වැටෙන බවත් අයවැයට ගත් තීන්දු වලට එහා ගිය වැඩ පිළිවෙළවල් වලට මුදල් වැය කිරීමට සභාවට සිදු වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමන්ලාගේ හදිසි යෝජනා මෙතෙක් දුර ක්‍රියාත්මක වී ඇති බවත් තමාගේ කමර්ාන්ත යෝජනා දෙකක් තාවකාලික ප්‍රශ්න මත

නවතා ඇති බවත් ජුනි මාසයේ ආදායම රු.9,662,671.64 වන අතර මෙහිදි හරි පාලන ප්‍රතිපූණර් නොතිබුණා නම් අපට ආදායම් සොයා ගෙන සභාවේ කටයුතු කරගෙන යාමට සිදු වන බවත් මධ්‍යම රජය පැත්තෙන් රජයේ ආදායම අඩු වුවත් ගැටළු තිබුනත් මෙතෙක් කල් කිසිදු ගැටළුවක් නොමැතිව පළාත් පාලන ආයතන වලට හා සියළුම රාජ්‍ය සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීමට රජය කටයුතු කර ඇති බවත් නමුත් යම් යම් අවස්තා වල රජයට රජයේ සේවකයින්ගේ වැටුප් ගෙවා ගැනීමටවත් හැකියාවක් නොලැබෙන බවට යම් යම් කථා පැවතුනද එම කාරණා එසේ නොවේ යන්න අද ඔප්පු කර ඇති බවත් මෙතෙක් දුරට සියළු මහජන ආධාර දීමනා රාජ්‍ය සේවක වැටුප් හා දීමනා ආදි සියල්ල රජය විසින් හරියාකාරව ඉටු කරමින් යහපත් තත්වයෙන් පවත්වා ගෙන යන බවත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදිය යුතු බවත් ජුනි මාසයේ ආදායම් වියදම් වාර්ථාවට අනුව ජල ගාස්තු, වරිපනම් ගාස්තු,ත්‍රීවිල් ගාස්තු අපට එකතු කල නොහැකි තත්වයක් වසංගත තත්වය නිසා උදා වී ඇති බැවින් මේ තරම් දුරට හෝ කටයුතු කරගෙන යාම ගැන සතුටු වන බවත් සඳහන් කරමින් ජුනි මාසයේ ආදායම් වියදම් වාර්ථාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

**<u>8. වෙනත්</u>**

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීම</u>**

**8 (1)උඩපළාත ප්‍රාදේශීය සභාව නියෝජනය කර පරලෝ සැපත් මොහොමඩ් මුන්ෂීර් මන්ත්‍රීතුමා වෙනුවෙන් ශෝකය පලකිරීම**

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

තමාගේ පරම යුතුකම සේ මෙම යොජනාව ඉදිරිපත් කල බවත් මෙය යොජනාවක් හැටියට නොව අදහස් දැක්වීමක් ලෙස ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදුන් බවත් ඉදිරියේදී අපට ගරු මන්ත්‍රිවරයකුගේ අභාවයක් වෙනුවෙන් ශෝකය පල කිරීමට පනත අනුව අවස්ථාව නොලැබෙන බවත් නමුත් අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත් කහටපිටිය ඉලංගවත්ත නියෝජනය කල අපේ මොහොමඩ් මුන්සීර් මැතිතුමා ප්‍රාදේශිය සභාවට දෙවරක් මහජන ඡන්දයෙන් තේරී පත්වී විශාල මහජන සේවාවක් ඉටු කල බවත් මීට ටික දිනකට ඉහතදී එතුමා අප අතරින් වෙන් වූ බවත් එම අවස්ථාවට අපේ ගරු සභාපතිතුමා ගරු උප සභාපතිතුමා සහ ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහෝදර සියළු දෙනා සහභාගී වූ බවත් ඉතා හොඳ ගතිගුණ තිබෙන මහ ජනතාව වෙනුවෙන් මනා කැපවීමක් සිදු කල මන්ත්‍රීවරයෙකු ලෙස ගරු මොහොමඩ් මුන්ෂීර් මන්ත්‍රීතුමා ගැන සඳහන් කල හැකි බවත් දිවංගත කාදර් මන්ත්‍රීතුමා සමීපයේ සිට කටයුතු කල බවත් තවද ආඩියාකඩවත සොහොන් පිටියට යන පඩිපෙළ තමා සහ මුන්ෂීර් මන්ත්‍රීතුමා එක්ව රු.25000.00 මුදලක් සභා අරමුදලින් වැය කර සංවධර්නය කල බවත් තමා සමඟ එක්ව විවිධ කටයුතු ඉටු කල මෙතුමාට අපේ ආගමට අනුව නිවන් සුව ප්‍රාථර්නා කරන බවත් අන්‍ය ආගමික මුස්ලිම් ජාතිකයෙකු නිසා අල්ලාහ් දෙවියන්ගේ ආශිවර්ාදය ප්‍රාථර්නා කරන බවත් වසර තිහක කාලය තුළ උඩපළාත ප්‍රාදේශීය සභාව තුළ විශාල නායකයින් පිරිසක් අභාවයට පත් වූ බවත් තමා කළගුණ දන්නා අයෙකු ලෙස ඒ සියළු දෙනා සිහිපත් කරන බවත් නමුත් සමහර නායකයින් අපෙන් වැඩ කරගෙන ඉවත් කර දමන බවත් දිවංගත මහජන නියෝජිතයින් ලෙස කටයුතු

කල ගරු සභාපතිව සිටි පුංචිරාළ මැතිතුමා,ජස්ටින් ගුණවර්ධන මන්ත්‍රීතුමා,ජයසිංහ රත්නසූරිය මන්ත්‍රීතුමා තමාගේ ඥාතියෙකු වන එල්.ඒ.විජේසූරිය මන්ත්‍රීතුමා,නන්දසේන මන්ත්‍රීතුමා,හෙක්ටර් රත්නායක මන්ත්‍රීතුමා,වෝල්ටර් විජේවර්ධන මන්ත්‍රීතුමා,අපේ කල්‍යාණ මිත්‍ර සුසන්ත ප්‍රියදශර්න ගරු මන්ත්‍රීතුමා යන සියළු දෙනා පක්ෂ විපක්ෂ බේදයකින් තොරව උඩපළාත ජනතාවට විශාල සේවා ඉටු කල බවත් ඉතා ගෞරවයෙන් ඔවුන් සිහිපත් කරන බවත් තවද ප්‍රාදේශීය සභාව තුළ දීප්තිමත් තරුවක් ලෙස කටයුතු කල රූපසිංහ මන්ත්‍රීතුමාද ආදරයෙන් සිහිපත් කරන බව සදහන් කරමින් සියළු දෙනාටම නිවන් සුව ප්‍රාථර්නා කරමින් ශෝක පණිවිඩය අවසන් කරන ලදි.

## 8 (2) වසර 30 ක මහජන සේවය සදහා උඩපළාතේ ජනතාව තමාට ලබාදුන් සහයෝගයට ස්තුතිය පුද කිරීම

වසර 30ක කාලය කොමසාරිස් පාලන කාල සීමාවන් නිසා වසර 4ක් පමණ අඩු වන බවත් ඒ අනුව වසර 26ක සේවා කාලයක් ප්‍රාදේශීය සභාව තමා නියෝජනය කල බවත් මෙම කාලය තුළ උඩපළාතේ තමාගේ සහෝදර ජනතාව පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව තමාව දිරිමත් කල බවත් සමහර නායකයින් එක් කෙනෙක් දෙදෙනෙකු හැරුනු විට තමාට නොසැලකූ බවත් අත්හල බවත් නමුත් ජනතාව එසේ නොකල බවත් මෙම කාලය තුළ සිව් වතාවක් එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කර විශිෂ්ඨ ජයග්‍රහණ ජනතාව තමාට ලබාදුන් බවත් දෙවරක් තමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරඟ කල බවත් එහිදිද මහනුවර ජනතාව විශිෂ්ඨ ජයග්‍රහණයක් තමාට ලබාදුන් බවත් එනිසා එදා මෙදා තුර කාලය තුළ උඩපළාත ජනතාව තමාට දැක්වූ සහයෝගය ආදාරය ගෞරවයට ශීෂර් ප්‍රණාමය පුද කරන බවත් එසේම අපේ මහ ඇමතිතුමා දිවංගත කාදර් මැතිතුමා,චන්ද්‍රමන්ද සිල්වා මැතිතුමා,ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා ඉතා ආදරයෙන් සිහිපත් කරන බවත් තිස්ස අත්තනායක ගරු මන්ත්‍රීතුමා, ලකී ජයවර්ධන මැතිතුමා, පීටර් ගගහාගෙදර මැතිතුමා ඉතා ආදරයෙන් සිහිපත් කරන බවත් තමාට සිදුවූ අකටයුතුකම් හැල්ලුවීම් සිදු වන අවස්ථාවල මේ සියළු දෙනා ඉදිරියට එන නායකයෙකු ලෙස තමාට ආශිවර්ාද කල බවත් දේශපාලන තීන්දු මත තමා වෙනත් පැත්තකට ගිය බවත් එහිදි දිවංගත ගරු අග්‍රාමාත්‍ය දී.මු.ජයරත්න මැතිතුමා සියළු තැන්හීදි තමාගේ වටිනාකම සභාවට තරඟ කල වාර දෙකෙහිදි ජනතාවට පෙන්වා දුන් බවත් එසේම ගරු අනුරාධ ජයරත්න මැතිතුමා දේශපාලනයට පිවිස පළාත් සභාවට පැමිණි සමයේ ගරු ශාන්ත මන්ත්‍රීතුමා, ගරු වේරපිටිය මන්ත්‍රීතුමා සහ තමා එක්ව කටයුතු කල බවත් වාහන පහසුකම් පවා සලසා දුන් බවත් එතුමාවද ඉතාම ආදරයෙන් සිහිපත් කරන බවත් දේශපාලන ගමනේ අපට ඇති වූ ගැටළු වලදී පිහිට වූ නායකයෙකු ලෙස කැබිනට් ප්‍රකාශක ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා සදහන් කරන බවත් දේශපාලන ගමන් මගේදී ජනතාවට සේවය කිරීමට උදව් උපකාර කල නායකයින්ට තමාගේ ශීෂර් ප්‍රණාමය පුද කරන බවත් නැවත තමාගේ පැරණි පක්ෂයට අවතීණර් වීමේදී ගරු අසේල අමරසේන උප සභාපතිතුමා එතුමා සමඟ එක්ව කටයුතු කරන ලෙස දැන්වූ බවත් විය යුතු යුතුකම් සියල්ල එතුමා ඉටුකල බවත් ගරු අසේල අමරසේන උප සභාපතිතුමා දේශපාලන ගමනේ සිටිය යුතු බුද්ධිමත් ඉතාම හොද නායකයෙකු ලෙස තමාගේ ස්තුතිය එතුමාට පුද කරන බවත් සදහන් කරන ලදි.

## 8 (3)ගම්පොල ආසනයේ සමගි ජන බලවේගයේ ප්‍රධාන සංවිධායක ධුරයෙන් පිදුම් ලද ගරු උප සභාපති අසේල අමරසේන මැතිතුමාට සුභ පැතුම් පුදකිරීම

ගම්පොල මැතිවරණ කොට්ඨාශයේ ප්‍රධාන දේශපාලන පක්ෂ ලෙස එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එක්දහස් නවසිය හැට ගණන් වල සිට විවිධ පතාක

යෝධයන් බිහි වූ බවත් ඩබ්.පී.බී.දිසානායක,දී.මු ජයරත්න වැනි නායකයන් ආසනයෙන් බිහි වූ බවත් අපේ පන්තියේ කෙනෙකු ලෙස ගම් සභාවෙන් පැමිණ නායකත්වයට පත් වූයේ දී.මු. ජයරත්න අගමැතිතුමා පමණක් බවත් අනෙක් අය ගම්පොල නගරයේ සිට නායකත්වය ගෙන සේවය කල බවත් නමුත් .මු ජයරත්න අගමැතිතුමාගේ ගමන මෙන් අද අපි සමගි ජන බලවේගයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස ගරු අසේල අමරසේන මැතිතුමා පත්කර ඇති බවත් මේතාක් ගම්පොල ආසනයට සංවිධාකවරයෙකු නොසිටිය බවත් අපට නියම නායකත්වයක් කල හැකි පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව ආගම් කුළ භේදයෙන් තොරව සියළු දෙනා සමඟ සුහදව හිත දිනාගෙන සිටින නියම පුද්ගලයා ලෙස සමඟි ජන බලවේගයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස පත්වූ බවත් ඒ සම්බන්ධයෙන් උඩපළාත ප්‍රාදේශීය සභාවේ අපේ කණ්ඩායමේ සියළු දෙනාගේ සුභ පැතුම් ගරු අසේල අමරසේන මැතිතුමාට ගෞරවයෙන් පුද කරන බවත් එතුමාගේ පත්වීම ලබාදී ඇත්තේ සමඟි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා බවත් ගාමිණි දිසානායක මැතිතුමාගෙන් පසුව රටේ ජාතික නියකයෙක් ලෙස කටයුතු කල දි.මු ජයරත්න මැතිතුමාගෙන් පසුව රටේ ජාතික නායකයෙක් ලෙස සජිත් ප්‍රේමදාස මැතිතුමා අද උදෑසන දූරකථනයෙන් අමතා තමාගේ 56 වන උපන්දිනයට සුභ පැතූ බවත් අපි වගේ ග්‍රාමීය මට්ටමේ දේශපාලනයේ යෙදෙන අයට මෙලෙස සුභ පැතීම වටිනා බවත් ගරු තිස්ස අත්තනායක මැතිතුමා, ගරු රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමාද උපන්දින සුභ පැතුම් එක් කල බවත් එලෙසම ගමේ දුක් විඳින ජනතාවගේ නායකයෙකු ලෙස ගරු අසේල අමරසේන මැතිතුමාට මෙම පත්වීම ලබාදීම සම්බන්ධයෙන් ගරු රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමාටත් මෙම පත්වීම ලබාදීමට කටයුතු කල අපේ පක්ෂයේ නියෝජ්‍ය නායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාටද ස්තූතිවන්ත වන බවත් එතුමාව ආදරයෙන් සිහිපත් කරන බවත් ගරුඅසේල අමරසේන මැතිතුමාගේ දේශපාලන ගමන් මගේ පිටුපසින් තමා සිටින බවත් එතුමාට අවශ්‍ය ශක්තිය ධෛර්‍ය ලබා දෙන බව සඳහන් කරමින් සියළු දෙනාට තෙරුවන් සරණ ප්‍රාථර්නා කරන ලදි.

**(9) ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම -**

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ඉදිරි මහ සභා දිනය තීරණය කල නොහැකි බවත් පවත්නා තත්වය අනුව සභාව පවත්වන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අද දින සභාවට නොපැමිණි ගරු ***මන්ත්‍රීතුම***න්ලාගේ සහ ***මන්ත්‍රීතු***මියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා සභාවට යොමු කරන ලදි.

**<u>ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය</u>**

අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි

**<u>ගරු කෝකිලා වරාහේන මන්ත්‍රීතුමිය</u>**

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින කොරෝනා වසංගත තත්වය තිබියදීත් උඩපළාත බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය වෙනුවෙන් මහ සභාවට සහභාගී වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් ස්තූතිවන්ත වන බවත් රටේ තිබෙන තත්වය අනුව මහ සභාව පවත්වන බවත් සදහන් කරමින් සියළු දෙනාට තෙරුවන් සරණ ප්‍රාථර්නා කරමින් පෙ.ව.12.30.ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

ලේකම් සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව උඩපළාත ප්‍රාදේශීය සභාව